නැණ පියස E-NANAPIYASA
Weekly School Department of Education, Sabaragamuwa Province/ Weekly School

# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

**විෂය - නර්තනය**

**දෙවන වාරය- ජූනි මාසය - සතිය - 03**

**ශ්‍රේණිය - 9**

**සැකසුම - එම්. ඒ. රංගන එම්. මුණසිංහ මයා**
**ර/නිවි/රඹුක ජාතික පාසැල , කලවාන.**

## උඩරට නර්තන සම්ප්‍රදාය.

නිපුණතා මට්ටම : ශ්‍රී ලාංකේය නර්තන කලාවේ ඓතිහාසික පසුබිම විස්තර කරයි.

ක්‍රියාකාරකම : ශ්‍රී ලාංකේය නර්තන කලාව හා සම්බන්ධ මූලාශ්‍ර හඳුනා ගනිමු. ( සෙල් ලිපි,සංදේශ කාව්‍ය)

- **මෙම පාඩමට අදාලව පහත ක්‍රියාකාරකම් ඔබ විසින් සිදුකල යුතුව ඇත.**

පළමු පියවර : ඔබ 8 ශ්‍රේණියේදී ඉගෙන ගත් මූලාශ්‍ර පිළිබඳව නැවත දැනුම සිහිපත් කරන්න.

දෙවන පියවර : මෙරට පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් සෙල් ලිපි දක්නට ඇති ස්ථාන හා ඒවායේ වැදගත්කම සොයන්න.

තුන්වන පියවර : මෙරට ලියවී ඇති සංදේශ කාව්‍ය හා ඒවා පිළිබඳව විස්තර සොයන්න.

හතරවන පියවර : නර්තන කලාව හා සුවිශේෂී වන සෙල්ලිපිවල තොරතුරු හා සංදේශ කාව්‍ය වල කවි එක්රැස් කරන්න.

පස්වන පියවර : පාලමොට්ටායි/සැස්සේරුව/කොරවක්ගල,තිසර/සැළලිහිණි/පරවි සංදේශ ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| කරුණ | අදාල යුගය | ඒවායේ නර්තනය පිළිබඳව සඳහන් තොරතුරු/කවි | ඒවා පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න. |
|---|---|---|---|
| | | | |

අනුරාධපුරය යුගය - ක්‍රි.ව. 1-2 සියවස්වලට අයත් සැස්සේරුව සෙල්ලිපියේ නටන ගහපතියා විසින් පවරා දෙන ලදි යනුවෙන් සඳහන් වේ. කොරවක්ගල ලෙන් ලිපිය නටන ගහපතියාගේ දුව විසින් පවරා දෙන ලදි යනුවෙන් සඳහන් වේ. මෙහි 'ගහපතියා' යනුවෙන් දැක්වෙන්නේ නැටුම් පරම්පරාවක් සිටි බව ය.

පොළොන්නරුව යුගය - පාලමොට්ටායි සෙල් ලිපිය මෙම ශිලා ලිපිය අනුව දේවදාසීන් සිටි බවත් ඔවුන් නැටූ බවත් ලංකාව සොළීන්ට යටත් වූ පසුව මෙවැනි ආකාරයට දෙවියන් උදෙසා පූජා නැටුම් පැවැත්වීම ආරම්භ වූ බවත් පෙනේ. මෙම ලිපියට අනුව නළලෙහි සලකුණු තබා දේවදාසීන් හත්දෙනකු පිදූ බවත් ඔවුන්ට තැන්පත් කළ මුදලක පොළියෙන් කාසි ගෙවූ බවත් කියැවේ. කාලිංග වනයෙහි නෘත්‍ය ගීත බලා වැඩහිඳිනා සිංහාසනය යි, යනුවෙන් කාලිංග වනෝද්‍යානයේ ගල් ආසන ලිපියේ සඳහන් වේ.

ගම්පොළ යුගය - තිසර සන්දේශ කාව්‍ය 14 වැනි සියවසේ ලියන ලද බව පිළිගැනේ. මෙහි වාද්‍ය භාණ්ඩ හා නර්තන අංග පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර ඇත.

තහලම් තල බෙර තම්මැට පට තන්තිරි ඩමුරු
තඹ මේ ටක බෙර බොම්බිලි වීණා මිණි සුසිරු
බෙර මද්දල කහලම් රසු නිගළම් බඳ සොඳුරු
මෙසියල් මහ ගිගුමෙන් පළ කෙරෙමින් සිඳු අයුරු

නිලුපුල් දිගැසී තන රණ කලසී
විදුලිය සදිසී සියුමැලි දිගැසී
රඟ බැස නොලසී රඟ දෙන විලසී
දුටු එම විගසී මද තෙම ඇවිසී

කෝට්ටේ යුගය - සැළලිහිණි සන්දේශය

විදෙන ලෙලෙන නරු බර පුළුලුකුල රැඳී
හෙළන නගන අත නුවනග බැලුම් දිදී
රුවන දිලෙන අබරණ කැලුම ගත යෙදී
සැලෙන පහන සිළු වැනි රඟන ලිය සැදී

ලකල පුළුලුකුල බැඳි මිණි මෙවුල්ලා
සමග රන් සළඹ රැවු දී වෙවුල්ලා
වයන පදට තබමින් පද කමල්ලා
රඟන ළඳුන් බල රූ සිරි සියල්ලා

පරෙවි සන්දේශය
ලෙළඳුන් නව තඹ පලු වන් පාදේ - තබමින් නිවරද මද්දල නාදේ
ගයමින් පානා ගීයෙන් කීදේ - අඟනන් රඟ දුටුවන් සිතු පැදේ

ලෙලෙළනා දිගු නෙත නිලුපුල සේයා - ලෙළ පවනින් රන් ලිය විලසේයා
නළඟන රඟනා දක නොලසේයා - නළඟන නුවනත රඟ සැලැසේයා